මගේ අංකය BD/PGH/IC/2021/02

අධ්‍යක්ෂ,
පළාත් මහ රෝහල,
බදුල්ල.

2021.02.09

සියලුම ඒකක ප්‍රධානීන්,
සියලුම කාර්ය මණ්ඩල වෙත,
පළාත් මහ රෝහල, බදුල්ල.

**රෝහල තුළ රථවාහන ගාල් කිරීම හා රථවාහන සඳහා ඇතුල්වීමේ අවසරපත් නිකුත් කිරීම**

දැනට බදුල්ල පළාත් මහ රෝහල තුල සිදු කළ හා සිදු වෙමින් පවතින සංවර්ධන කටයුතු හේතුවෙන් දැඩි ලෙස රථවාහන ගාල් කිරීමේ ඉඩකඩ සීමා වී ඇත. එමෙන්ම, පසුගිය වසර කිහිපය තුළ කාර්ය මණ්ඩල සංඛ්‍යාව හා රථවාහන වලින් පැමිණෙන කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව ද ඉහළ ගොස් ඇත. එමනිසා, රෝහල තුළ දැඩි වාහන තදබදයක් නිර්මාණය වීම මගින් රෝගීන් ප්‍රවාහනය හා රෝගී සත්කාරයට බාධා ඇතිවේ.

ඉහත කාරණා සැලකිල්ලට ගෙන මින් ඉදිරියට රෝහලේ කාර්ය මණ්ඩලය සඳහා වාහන ඇතුළත් කිරීමේ අවසරපත් වර්ග දෙකකින් නිකුත් කරනු ලැබේ.

1. වාහන නවතා තැබීමේ අවසර පත්‍රය
2. වාහන රෝහල් භූමියට ඇතුළත් කිරීමේ අවසර පත්‍රය

**වාහන නවතා තැබීමේ අවසර පත්‍රය (Parking Pass)**

මෙම අවසර පත්‍රය හිමි වාහන රෝහලේ වාහන නැවතීමට ඇති රථගාල් වල නවතා තැබිය හැක. මෙම අවසර පත්‍රය සියළුම විශේෂඥ වෛද්‍යවරුන්, සියළුම වෛද්‍යවරුන්, විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරීන් (6), සියළුම ඒකක ප්‍රධානීන් හට හිමි වේ.

***මෙම අවසර පත්‍රය හිමි වුවද අදාල කලාප වල ප්‍රථමයෙන් පැමිණෙන්නාට ප්‍රමුඛතාවය හිමි වන ලෙස වාහන ගාල් කළ යුතුය.**

**වාහන රෝහල් භූමියට ඇතුළත් කිරීමේ අවසර පත්‍රය (Entry Pass)**

මෙම අවසර පත්‍රය සියළුම කාර්ය මණ්ඩලයට ලබා ගත හැකි අතර, මෙමගින් රෝහල් භූමියට ඇතුල් වී සුළු වෙලාවකින් පිට වී යා යුතුය. හදිසි අවශ්‍යතාවයකදී රෝහල ඉදිරිපිට ඇති පොදු රථ ගාලේ හෝ රෝහල පසුපස ඖෂධ ගබඩාව අසල පොදු රථගාලේ ප්‍රමුඛතා පිළිවෙලට රථ ගාල් කල හැක.

***රථ වාහන ගාල් කල හැකි ප්‍රදේශ සිතියම අමුණා ඇත.**

සියළුම කාර්ය මණ්ඩලය 2021 හා 2022 වර්ෂ සඳහා මෙම නව වාහන අවසර පත්‍රය ඉල්ලුම් කර කාර්යාලයෙන් ලබා ගත යුතු අතර, මෙම අවසර පත්‍රය අන්සතු කිරීම, නිලධාරියා නොමැති වාහන වල ප්‍රදර්ශනය කිරීම හෝ වෙනත් කටයුතු සඳහා අවභාවිතා කිරීම නොකළ යුතුය.

රථ වාහන ගාල් කිරීමේදී අවසර පත්‍රයේ ඇති අදාල කලාපය තුල හැකි සෑම විටම වාහනය ගාල් කරන්න.

රෝහල් පරිශ්‍රය තුළ සියළුම කාර්ය මණ්ඩල වාහන ගාල් කිරීමට ඉඩ ලබා දිය නොහැකි බව කරුණාවෙන් දන්වන අතර, ඒ පිළිබඳව ඔබ දක්වන සහය අගය කොට සලකමි.

.......................................

අධ්‍යක්ෂ,
පළාත් මහ රෝහල,
බදුල්ල.

Dr. Rohan C. Mapa
MBBS,Msc(Med. Admin)
Director
Provincial General Hospital
Badulla.

පිටපත් -

1. විෂය - අවසරපත් නිකුත් කිරීමට
2. ස්ථාන භාර ආරක්ෂක නිලධාරී - වාහන හැසිරවීමට

